ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

<u>නීති නිලධාරී තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම</u>

1.ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.ඒ සඳහා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද සහිත ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ලියාපදිංචි තැපෑලෙන් **ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබල ගැන්වීම් අමාත්‍යාංශය,1වන මහල, II අදියර, සෙත්සිරිපාය ,බත්තරමුල්ල** ලිපිනයට එවිය යුතුය.ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ **"නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම"** ලෙස ලිවිය යුතුය.අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026 දෙසැම්බර් 15** දින වේ.

සටහන:- අයදුම්පත ලියාපදිංචි තැපෑල මගින් එවීම අනිවාර්යය අතර,එය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ.අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරු විසින් විඳදරාගත යුතුය.

2. මෙහිදී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 01කි.පත්වීම ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

3.සේවා නියුක්ත කරවීමේ කොන්දේසි

3.1 සේවා ගණය-විධායක

3.2 මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත වන අතර මාසිකව රු.133,570.00 දීමනාවක් හා අනුමත ජීවන වියදම් දීමනාව ,ප්‍රවාහන දීමනා,දුරකථන දීමනා ගෙවනු ලැබේ.

3.3 මෙම පත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන කාරිය පටිපාටි රීති අදාල වේ.

3.4 තෝරා ගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද මුදල් රෙගුලාසිවලටද දෙපාර්තුමේන්තු නියෝගවලටද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම්

I. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම

II. පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයෙකු වශයෙන් වසර හය (06)කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම(සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පලපුරුද්ද ලබාගත් කාලය,සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කල දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය)

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනක නීතිමය තනතුරක වසර හය (06)කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.

(ලේකම්/දෙපාර්තුමේන්තු/ආයතන ප්‍රධාන විසින් නිකුත්කල ලිපියකින් සනාථ කර තිබිය යුතුය)

සටහන: මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. **සේවා කාලය ආරම්භ වන හා අවසාන වන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

*නීතීමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරුය.

III. කායික යෝග්‍යතාව

සෑම අපේක්ෂයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5.සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි

i. සේවා නියුක්තිකයන්ගේ රජයේ අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද,දෙපාර්තුමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.
iii. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ,ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

6.වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 62ට නොවැඩි විය යුතුය.

7. බඳවා ගැනීමේ ක්‍රමය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකුගේ සභාපතීත්වයෙන් යුතුව නීති ක්ෂේත්‍රයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු හා දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියෙකුගෙන් යුතුව සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් කරනු ලබන යෝග්‍යතා ඇගයීමකින් අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා නීති නිලධාරී තනතුරට බඳවා ගනු ලැබේ.

8. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරනු ලැබේ.

<table>
<tr><th>අනු අංකය</th><th>විෂය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>01</td><td>අතිරේක අධ්‍යාපන සුදුසුකම්
අ.) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලකින් ලබාගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය

ආ)විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලොමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලොමාවක්

ඇ)විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගන්නා ලද
• පළමු පන්තියේ සමාර්ථය සහිත නීතිවේදී උපාධිය
• දෙවන පන්තියේ ඉහළ සමාර්ථය සහිත නීතිවේදී උපාධිය
• පන්ති සමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය
• සාමාන්‍ය සමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය

ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය
නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය
සටහන I නිති විද්‍යාල අවසන් විභාගය ගෞරව සමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.
සටහන II ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.</td><td>25

20

15
10
07
05

10
05</td><td>25</td></tr>
<tr><td>02</td><td>අතිරේක පලපුරුද්ද
නඩුවලට අදාල ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම්
<table><tr><th></th><th>නඩු ගොනුකිරීම් (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු(එක් නඩුවක් සඳහා)</th></tr><tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr><tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr><tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr><tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr><tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr></table>සටහන-
ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල නඩු තීන්දු වල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළයුතුය</td><td></td><td>35</td></tr>
<tr><td>03.</td><td>තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම

(අ) විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය විසින්</td><td>10</td><td>10</td></tr>
</table>

	පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක් (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. (ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය විසින් පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතිකපත්‍ර (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ) **සටහන** :ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.	08 05 04	
04	භාෂා හැකියාව (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුලත්ව ලබාගත් උපාධිය (ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරඟවලදී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව <u>කේවල</u> ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව-12 දෙවන ස්ථානය-10 තෙවන ස්ථානය/වෙනත් කුසලතා -08 <u>කණ්ඩායම්</u> ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව-10 දෙවන ස්ථානය-08 තෙවන ස්ථානය/වෙනත් කුසලතා -06 (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලොමාවක් හෝ වෙනත් ආයතනකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ ආයතනකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලොමාවක් (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගයේදී (දේශීය හෝ ලනඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධිසමාර්ථ ලබා තිබීම හෝ ILETS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ , TOEFL-IBT 79 හෝ ඊට ඉහළ TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම	15 12 10 08	15

	(ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක් **සටහන** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ	05	
05	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භක වන අයදුම්කරුගේ ○ ශක්තීන් ○ අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව ○ දක්ෂතාවය ඇගයීමට ලක්කිරීම අරමුණු කරගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ.		15
06.	එකතුව		100

9.අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියළුම සහතික පත්වල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසිපරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළයුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

10.අයදුම්පත් ඉදිරිපත් කලයුතු ආකාරය

I. ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ.අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 3.4 දක්වාත් දෙවැනි පිටුව 3.5 සිට 8.0 දක්වාත් තෙවැනි පිටුව 9.0 සිට 11.0 දක්වාත් වන ආකාරයේ පිළියෙල කර තමාගේ අත්අකුරින් සම්පූර්ණ කළ යුතුය.

II. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු /සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතිඥවරයෙකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරීවරයෙකු හෝ රු.47,615/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථීර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කලයුතුය.

III. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍ර යේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ.එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12.පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මා සතුවේ.

13.මෙම නිවේදනයේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

14.මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව මා විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ලේකම්

ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ පුජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය